# නොසිතූ ඉරණම



සෙනුදි දිනන්යා ලොකුසූරිය

# නොසිතූ ඉරණම

සෙනුදි දිනන්යා ලොකුසූරිය

# නොසිතූ ඉරණම

## සෙනුදි දිනන්යා ලොකුසූරිය

**වෙනත් කෘති**

පවනිගේ සිහිනය (2020)

කෑම පෙට්ටියේ රහස (2023)

ප්‍රකාශිතය දිනය -2025.02.08

**ISBM - 978-624-208-584-5**

# පිදූම

මේ පොත ලිවිමට උදවු වූ
දෙමාපියන්ටද,ගුරුමැණිවරුන්ටද, මේ
අනගි අවස්ථාව ලබා දුන් මහාමයා පාසල්
මවුණි මේ පිදූම ඔබලාට

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

දික්පිටිය රන්වන්තලාව ගම්මානය පිහිටියේ පිටිසර බදය.කඳු වළල්ලකින් වට වූ එම ගම්මානයේ  බොහෝ මිනිස්සු ජීවත් වූවෝය.ඔවුන් අතර එදා වේල සපයා ගැනීමටවත් නොහැකි මිනිසුන්ද සිටිති.



එම ගම්මානයේ කුඩා පාසලක් ද විය.එම පාසලේ දරුවන්ට ඉගෙන ගැනීමට පුටුවක්වත් නොතිබුණි.




කාගෙත් ආදරයට පාත්‍ර වූ පවුලක් මෙහි විය. එම පවුල ඉතා අසරණ පවුලකි. ඒ පියා අහිමි වූ මව සහ දරුවන් දෙදෙනෙකුගෙන් යුතු පවුලකි. එම පවුලේ වැඩිමහල් පුතා වූ නිමල් කරුණාරත්න වයස අවුරුදු දහයක පමණ දරුවෙකි. ගැහැණු දරුවාගේ වයස අවුරුදු හතක් පමණය. නමින් සඳමාලි වූ ඇය ඉතාමත් හුරු බුහුටිය.



මේ දරු දෙදෙනා ජීවත් කරවීම සඳහා මව අහළ පහළ ඇති නිවෙස් වල කුලි වැඩ කරයි. ගමේ පාසලට යන මේ දරුවන් දෙදෙනාගෙන් නිමල් ඉගෙනීමට ඉතාම දක්ෂයෙකි .පාසල් නිම වූ පසු  නිමල් තම මවගේ හා නැගණියගේ කටයුතු වලට බෙහෙවින් උපකාර කරයි.අහළ පහළ ගෙවල් වලට ගොස් උදව් උපකාර කරන නිමල්ට ඔවුන්ගෙන් ලැබෙන රුපියල් දහය පහළොව ගෙනවිත් අම්මාට දෙන්නේ නිවසේ අඩුපාඩු පිරිමසා ගැනීම සඳහා ය. එහෙත් මව එයින් කොටසක් නිමල්ට දෙන්නේ  පාසලේ ඉගෙනුම් කටයුතු සඳහා පොත් පත් ලබා ගැනීමට ය.එහෙත් එම මුදල එයට ප්‍රමාණවත් නොවේ.නිමල් එම මුදල් එකතු කොට පොත් පත් මිලදී ගනී.





දිනක් සුපුරුදු පරිදි නිමල් සහ සඳමාලි පාසැල් ගියෝය. එහිදී ඔවුන්ට පාසැලේ විදුහල්පතිනිය හමුවිය. එවිට විදුහල්පතිනිය නිමල්ට කතාකර පැවසුවේ ළඟ එන ශිෂ්‍යත්ව විභාගයට නිමල්ගේ නම ඇතුලත් කරන බවත් ඔහු ඉගෙනීමට දක්ෂ බැවින් ශිෂ්‍යත්වය සමත් විය හැකි බවත් ය. එබැවින් හොඳින් ඉගෙනීමේ කටයුතු කරන ලෙස පැවසීය.

පාසල නිම වී පැමිණෙන නිමල් මෙ දින කුලි වැඩ සඳහා ගියේ නැත.කුලි වැඩ නිම වී නිවසට පැමිණෙන අම්මාට නිමල් මෙසේ පැවසිය."අම්මේ, අද මමයි නංගියි ඉස්කෝලේ යද්දි විදුහල්පතිනිය මුණ ගැසුණා. විදුහල්පතිනිය කිව්වා මට හොඳට ඉගෙන ගන්න පුළුවන් කියලා. ඒ නිසා මගේ නම ශිෂ්‍යත්ව විභාගයට ඇතුලත් කරනවා කිව්වා. මට සමත් වෙන්න පුළුවන් කියලත් කිව්වා. මම ශිෂ්‍යත්ව විභාගය ලියන්නද ? " කිසිවක් කරකියා ගැනිමට නොහැකි වූ අම්මා "පුතේ, අපට ලොකු ඉස්කෝල වලට යන්න කොහෙන්ද සල්ලි. නිකන් ඉන්න පුතේ" කියා ගෙන පැල්පත තුලට ගියාය.

සිතේ කනස්සල්ලක් ඇති වුවද එය අම්මාට නොපෙන්වා සිටීම නිමල්ගේ පුරුද්දකි. නංගීගේ පාසල් වැඩ වලට කුප්පි ලාම්පුවක් තබා ගෙන උදව් කරමින් තමාද පොත් බිම තබා ගෙන ඉතා දුක සේ පාසල් වැඩ වල යෙදෙන නිමල්ට දහසක් දේ නොසිතුනා නොවේ.



එහෙත් නිමල් සුපුරුදු පරිදි පාසල් ගියේය .පාසලේ ගුරුවරු නිමල්ට ශිෂ්‍යත්වයට පැමිණෙන සෑම දෙයක්ම කියා දුන්නෝය. කෙසේ නමුත් දින, සති වකවානු ගෙවී ගියේය. ශිෂ්‍යත්ව විභාගය පැවැත්වෙන දිනයට පෙර දින උදාවිය. නැවතත් නිමල් මවගෙන් මෙසේ ඇසිය. "අම්මේ, මම ශිෂ්‍යත්ව විභාගය ලියන්නද?" මව කඳුළු පුරවාගත් දෙනෙතින් "උඹට ඕන දෙයක් කර ගන්න ලොකු ඉස්කෝල වලට යන්න සල්ලි කොහෙන් හොයන්නද?" යැයි පැවසිය.

විභාගය පැවැත්වෙන දිනය උදාවිය. අනික් දරුවන්ගේ දෙමාපියන් බොහෝ උනන්දුවෙන් තම දරුවන් රැගෙන විභාග ශාලාව වෙත පැමිණෙනු දුටු නිමල්ගේ දෑසට කඳුළු ආවේය. ඒ මන්ද තමාගේ මවට එවැන්නක් කිරීමට නොහැකි වූ නිසාය.



කෙසේ වුවත් විභාගය අවසන් වී නිවසට ගිය නිමල් වෙනදා මෙන් අහළ පහළ ගෙවල් වලට උදව් කිරීම සඳහා ද ගියේය. කුලී වැඩ නිම වී නිවසට ආ අම්මා නිමල් ගෙන් විභාගය පිළිබඳ කිසිම දෙයක් ඇසුවේ නැත . නිමල් එයට ද ශෝක නොවිය.

සුපුරුදු පරිදි ජීවිතය ගෙන ගිය මේ තිදෙනාට දින,සති, මාස ගණන,ගෙවී ගියේ නොදැනීමය. කිසිම බලාපොරොත්තුවක් නොමැතිව වෙනදා මෙන් නිමල් තම නැගණිය වූ සඳමාලි සමඟ පාසලට පැමිණියෝය. එවිට පාසලේ උදෑසන රැස්වීම පැවැත්වීමට සූදානම් විය. විදුහල්පතිනිය සමඟ ගුරු මණ්ඩලයේ සියලුම ගුරුවරුන් මෙයට සහභාගී වූහ. පන්සිල් ගැනිමෙන් පසු නිමල්ගේ නම කියා ඉදිරියට පැමිණෙන ලෙස විදුහල්පතිනිය ආරාධනා කළාය. නිමල් කුතුහලයෙන් ගුරු මණ්ඩලය අසලට ගියේය. එවිට විදුහල්පතිනිය අසුනෙන් නැගිට නිමල්ව වැළඳ ගත්තාය. එවිට එක් ගුරුතුමියක් උදෑසන රැස්වීමට සහභාගී වී සිටින සියලුම දෙනාට මෙසේ පැවසිය."මේ පළාතෙන් ශිෂ්‍යත්ව විභාගයට වැඩිම ලකුණු අරගෙන තියෙන්නේ නිමල්, එයාට කොළඹ ලොකු ඉස්කෝලෙකට යන්න පුළුවන් " නිමල්ට කිසිම දෙයක් සිතා ගැනිමට නොහැකි විය. නිමල්ට හිතුනේ මෙය හීනයක්ද යන්නයි. නිමල්ට සතුටු කඳුළු වැටුණේය. සියලුම සිසුන්ගේ අත්පොලසන් මැද විදුහල්පතිනිය හා ගුරුවරුන් තවත් තදින් නිමල්ව වැළඳ ගත්තෝය.



පාසල නිමවී කඩිමුඩියේ නිමල් නිවසට පැමිණියේ මේ සුභ පණිවිඩය තම මවට පැවසීමටයි. එදා නිමල්ගේ මව වැඩ කලේ ගම් මුලාදැනීතුමාගේ නිවසේය. නිමල් තම මවට කතා කොට මෙසේ පැවසීය. " අම්මේ, අද විදුහල්පතිතුමිය සහ ගුරු මණ්ඩලය උදැසන රැස්වීමක් සංවිධානය කර තිබුණා. ඒ වේලාවේ මුළු පළාතෙන්ම ශිෂ්‍යත්ව විභාගයට වැඩිම ලකුණු අරගෙන තියෙන්නේ මමයි කියලා කිව්වා." එවිට මවට එය අදහා ගැනිමට නොහැකි විය. නැවතත් නිමල්ගේ මව " උඹ ඔය කියන්නේ ඇත්තක්ද මයේ පුතේ....." කියා ඇසීය. එවිට නිමල් මෙසේ කීය" ඔව් අම්මේ, හෙට මට යන්න තියන ඉස්කෝලෙයි ලකුණු ගාන තියන ලියුමයි දෙන්නම් කිව්වා"

එම විස්තරය අසා සිටි ගම් මුලාදැනිතුමා මෙසේ පැවසීය. " අනේ කොල්ලෝ උඹට හරියන්නම ඕනෑ. මට ගොඩක් සතුටුයි. උඹට හොද ඉස්කෝලයක් විතරක් නොවේ මාසිකව ආධාරයකුත් හම්බවෙනවා. මමත් උඹට අද වැඩියෙන් කියක් හරි දෙන්නම් .මේ කොල්ලට පොත් ටික අරන් දීපන්."

නිමල්ට කොළඹ හොදම පාසලකුත්, මාසික ආධාරයක් ලෙස රුපියල් පහළොස් දහසක මුදලකුත් ලැබෙන බව විදුහල්පතිනිය  පැවසිය.





නිමල් එම පාසලේ දී සාමාන්‍ය පෙළ විභාගය හොදින් සමත් විය.උසස් පෙළ තෙක් මෙම පාසලෙ ඉගෙන ගන්නා නිමල් එයද විශිෂ්ට ලෙස සමත්ව වැඩි දුර අධ්‍යාපනය සඳහා පිටරට විශ්ව විද්‍යාලයකට යාමට ශිෂ්‍යත්වයක් ලබා ගත්තේය.



එහිදි  ඔහු හොදින් ඉගෙන ගෙන නැවත ලංකාවට පැමිණ, දික්පිටිය රන්වන්තලාව යන ඔහුගේ ගම අසල පිහිටි රෝහලකට වෛද්‍යවරයකු ලෙස පැමිණියේය. ඉන් පසු ඔහු දික්පිටිය රන්වන්තලාව ගම්මානයට ගොස් එහි රෝහලක් තනා පාසලද අලුත්වැඩියා කොට එම පාසලේ සිසුන්ට පොත් පත් ලබා දුන්නේය. ඉන් පසු ඔහු එම රෝහලට මාරුවීමක් ගෙන තමාගේ ගමටම පැමිණියේය. තවද ඔහු තමාගේ නැගණියටද උදව් කරමින් එම ගමේම ජීවත් විමට සුදානම් විය. නිමල්ගේ මේ නොසිතු ඉරණම අපගේ ජීවිත වලටත් ආදර්ශයක් ගෙන දෙන්නේය.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්